# 20
# මුල් කිතුනු සභාවෙන්

ගලාති 2 : 11 13

සිතන්න ඔබ පේදුරුගේ ක්‍රියාව දෙස බලන්නේ කෙසේ ද?

අප කලින් පාඩමේ දී අවධාරණය කරනු ලැබුවේ වර්තමාන සමාජයට ජුදෙව් සමාජයේ වටිනාකම් අනුගත කරන අන්දම පිළිබඳ ව ය. මෙහි දී වර්තමාන සමාජයට මුල් කිතුනු සභාවේ වටිනාකාම් අදාළ කර ගන්නේ කෙසේ දැ යි සලකා බැලීමට යොමු වෙමු. ජුදෙව් සමාජයේ මෙන් ම මුල් කිතුනු සභාවේ ද අයහපත් අංග පැවති බවත් ඒ මඟින් අයහපත් බලපෑමක් සිදු වූ බවත් අප අමතක නොකළ යුතු ය.

## මුල් සභාවේ පැවති යහපත් වටිනාකම්

මේවා අනාවරණය කරගත හැකි වන්නේ මුල් සභා සාමාජිකයන්ගේ ජීවිත රටාව, ක්‍රියාකාරීත්වයන් සහ චින්තනය මගිනි. ඒවා පහත සඳහන් වේ.

1. ගෝලයින්ගේ ඉගැන්වීම් පදනම් වූ ජීවිතය (ක්‍රියා 2 : 42 47 , ක්‍රියා 4 : 32 37 )
2. සහභාගිත්වය / මිත්‍රශීලිත්වය ( ක්‍රියා 6 : 1 7 )
3. එකමුතු ව රොටි කැඩීම ( ශු. සහභාගිකමේ මෙහෙය )
4. යාච්ඤාව
5. පොදු දේපළ
6. එක්සත් භාවය
7. බෙදාගැනීම
8. සරල බව
9. දෙවිඳුන් කෙරේ ගැඹුරු ඇදහිල්ල
10. ක්‍රිස්තු උත්ථානයට සාක්ෂි දැරීම

ජේසුස් වහන්සේගේ ගෝලයෝ උන්වහන්සේගේ උත්ථානය අත්දුටුවෝ ය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ සැනසිල්ල හා ශක්තිය ඔවුන් සමඟ විය. ගෝලයින් ජීවත් වූයේ දේව රාජ්‍යත්වයේ වටිනාකම් සහිතව ය. ආරම්භයේ දී ජේසුස් වහන්සේ කෙරෙන් යැපුණු සභාව පසුකාලීන ව ගෝලයින්ගේ ඉගැන්වීම් අනුගමනය කරන්නට විය.

යාච්ඤාවේ ජීවිතයක් ගත කළ මුල් සභා සාමාජිකයෝ මිත්‍රශීලී ව සහභාගිත්වය පවත්වා ගනිමින් විසූහ. රොටි කැඩීම තුළින් ඔවුන් අතර පැවති සබඳතා තර වීය. "එක සිත සහ එක ආත්මය" යන්න ජීවමාන කරමින් ඔවුහු එක්සත් ව එක්සිත් ව කාලය ගත කළෝ ය. ඔවුන්ගේ සරල ජීවන පැවැත්ම ද දේපළ පොදුවේ තබා ගැනීම ද අවශ්‍යතා අනුව ඒවා බෙදා ගැනීම ද තත්කාලීන සමාජයට මහත් අභියෝගයක් විය. ජේසුස් වහන්සේගේ චින්තනය පදනම් කරගත් වටිනාකම් මඟින් ලෝකය වෙනස් කළ හැකි බව ඔවුන් වෙතින් ප්‍රදර්ශනය විය. ඔවුන් නපුර ඈත් කළ අතර යහපත් ක්‍රියාවන්හි නිරත වූ බව පැහැදිලි ය.

අයහපත් දෑ මඟින් මුල් සභා ජීවිතයට ගැටළු සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවූවත් මුල් සභා සමාජිකයන්ගේ ජීවන රටාව ලෝකයට යහපත් වටිනාකම් දායාද කළ බව ප්‍රත්‍යක්ෂ කරුණකි.

## මුල් සභාව තුළ දක්නට ලැබුණු අයහපත් ලක්ෂණ

මේ මඟින් යම් යම් ප්‍රශ්න උද්ගත වූ අතර අන්තියෝකියෙහි පේදුරු තුමාගේ ක්‍රියාකාරිත්වය විමසීම උචිත ය.
කියවන්න ගලාති 2 : 11 14

පේදුරු තුමා මුල් සභා සාමාජිකයන්ගෙන් කෙනෙකි. අන්‍යජාතීන් දෙවියන් වහන්සේගේ ජනතාව ලෙස සලකමින් ඔහු ක්‍රියා කළේ ය. එහෙත් ( ක්‍රියා 10 ) අනුව ඔහු ආහාර ගැනීමට සූදානම් වූ විට කටයුතු කළේ ජුදෙව් වර්ගවාදය අනුගමනය කරමිනි. පාවුල් තුමා මෙම ක්‍රියාව දැඩි ලෙස හෙළා දුටුවේ ය.

ජුදෙව්වරුන්ට ආහාර ගැනීමේ කාලය ඉතා වැදගත් විය. දෙවිඳුන් ස්තුති ප්‍රශංසා කිරීම ප්‍රසාද ජනක සංවාදයන්හි යෙදීම හා සහභාගිත්වය වර්ධනය කර ගැනීම භෝජනය අතරතුර දී සිදු විය. දේව ප්‍රශංසාවෙන් තොර ව ආහාර වැළඳීම ඔවුන් සැලකුවේ සතුන්ගේ හැසිරීම් විලාශයක් ලෙසිනි. සභාවට දෙනු ලබන දසයෙන් කොටස පිදීමෙන් තොර ව ආහාර වැළඳීම දෙවිඳුන් අවමානයට පත් කරන්නක් ලෙස සැලකිනි.

සබඳතාවයෙන් තොර ව ආහාර අනුභව කළේ නම් එහි අදහස පිළිමවලට නමස්කාර කිරීම විය. ආහාර ගැනීම පිළිබඳ ජුදෙව් චාරිත්‍ර අනුගමනය කල පේදුරු තුමා අන්‍යජාතීන් සමඟ ආහාර ගැනීමට අකමැති වීම යහපත් ප්‍රතිචාරයක් නොවේ. පේදුරු තුමා ජුදෙව් නීතිය අනුව ජීවත් වූ ජුදෙව්වෙක් විය. අන්තියෝකියේ දී අන්‍ය ජාතීන්ට ශුද්ධාත්ම දීමනා ලැබීම පේදුරු තුළ වෙනසක් උදා කරවීමට සමත් විය. ඔහු අන්‍ය ජාතීන් හා සමඟ ආහාර ගත්තේ එබැවිනි. බාර්ණබස් අන්‍ය ජාතීන් සමඟ ආහාර ගැනීම නැවැත් වූහ. මෙම ක්‍රියාව නිසා අන්‍ය ජාතීන්ගේ සිත් පැරුණු අතර පේදුරු ගේ චින්තය ද ප්‍රශ්නයකට ලක් කිරීමට හේතුවක් පැණ නැගුනි.

මින් අපට පැහැදිලි වන්නේ පේදුරුතුමා තුළ වර්ග වාදය වැනි ජුදෙව් ආකල්ප තිබූ බවත් ඉන් පසුව ද විරුද්ධතා මධ්‍යයෙහි චංචල වූ ඔහු නැවතත් නිවැරදි පුළුල් ආකල්ප කෙරේ යොමු වූ බවත් ය. ඔහුගෙන් ප්‍රශ්න නැගූ අයට පිළිතුරු දී ඔවුන් නිශ්ශබ්ද කිරීමට ඔහු සමත් වූයේ එබැවිනි. ( ක්‍රියා 11 ፡ 1 18 )

එසේ ම තවත් අය තුළින් ද මෙවැනි අයහපත් ලක්ෂණ විද්‍යාමාන විය. තමා සතු කෙතක් විකුණා ඉන් ලත් මුදල් ගෝලයින්ගේ පාමුල තැබූ බාර්ණබස් යයි නම් ලත් ජෝසෙප් වැන්නන් අතර (ක්‍රියා 4 ፡ 36 37 ) ආත්මාර්ථකාමී පුද්ගලයෝ ද වූහ. (ක්‍රියා 5 ፡ 01 7 ) මුල් සභාව තුළ පැවැති සහනාධාර දීමේ ක්‍රියාවලියේ දී ග්‍රීක් ජුදෙව්වන්ගේ වැන්දඹුවන් නොසැලකීම ද තවත් අයහපත් අංගයක් ලෙස සැලකිය හැකි ය. ( ක්‍රියා 6 ፡ 1 7 )

## මුල් සභාව ජීවන රටාව හා යහපත් වටිනාකම

මුල් සභාව තුළ යහපත් වටිනාකම පැවති බව හෙළි වූයේ ඔවුන්ගේ ජීවන රටාව ඇසුරෙනි. පාවුල් පේදුරු ජාකොබ් හා ජොහාන් වැනි අය තුළ පැවති ස්වයං වැයවීමෙහි හා කැපවීමෙහි ස්වභාවය ඔවුන් තුළ පැවති යහපත් ආකල්ප අනාවරණය කිරීමට සමත් විය. අන්‍යයන් සමඟ යහපත් සබඳතා වර්ධනය කර ගැනීම මුල් සභාව තුළින් දිස්විය. (ක්‍රිය 10፡ 34 35 ) දෙවිඳුන් පිළිබඳ ව චින්තනයේ කැපී පෙනෙන වෙනසක් ඔවුන් තුළින් පැහැදිලි විය. අන්‍ය ජාතින් මධ්‍යයෙහි පාවුල් වෙනස් ලෙස කථා කළේ ය. (ක්‍රියා 14 ፡ 12 15 ) අඳී පියවරුන්ගෙන් පටන්ගෙන ඔහු කතාව නිම කළේ ජේසුස් වහන්සේගේ උත්ථානය ගැන පවසමිනි. (ක්‍රියා 13 ፡ 13 47 ) එසේ ම ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව පාවුල් පැවසී ය. (ක්‍රියා 9 ፡ 21 22 ) ලුස්ත්‍රාවේ දී මෙන් ම ඇතැන්ස් හී දී ද ඔහු දෙවිඳුන් ගැන පැහැදිලි කළේ ය. (ක්‍රියා 17 ፡ 16 34 ) ලුස්ත්‍රාවේ දී පාවුල් තුමා දේශනා කළ ශුභ ආරංචි වූයේ ජීවමාන දෙවිඳුන් වෙත හැරෙන්න යන්නයි. " ඔබ මේ නිශ්චල දේවලින් දුරු ව....... ජීවමාන දෙවියන් වහන්සේ වෙතට හැරෙනු පිණිස සුබ අස්න ඔබ වෙත ගෙනෙමු. " ( ක්‍රියා 14 ፡ 15 ) එසේම පාවුල්, දෙවිඳුන්ගේ ක්‍රියාකාරිත්වය අන්‍යජාතින්ට පැහැදිලි කළේ ය.

"ලෝකය ද එහි සියල්ල ද මවා වදාළ දෙවියන් වහන්සේගේ ස්වර්ගයටත් පොළොවටත් ස්වාමීන් ව සිටින බැවින් උන් වහන්සේ අතින් සාදන ලද මාලිගාවල නොවසන සේක. උදව් උපකාරයෙන් යැපෙන අයකු සේ උන්වහන්සේ මිනිස් අත්වලින් උපස්ථාන නොලබන සේක. මන්ද සියල්ලන්ට ම ජීවිතය ද හුස්ම ද අන් සියලු දේ ද දෙන්නේ දෙවියන් වහන්සේ ය." ක්‍රියා (17 ፡ 24 26)

"අප දෙවියන් වහන්සේගේ දරුවන් වන බැවින් දේවත්වය වනාහි මිනිස් කලා ශිල්පයෙන් හා දක්ෂකමෙන් හා කැටයම් කළ රිදියටවත්, ගලටවත් සමාන යයි නොසිතිය යුතු ය." ක්‍රියා 17 ፡ 29

අන්‍යජාතින් අමතා පාවුල් කළ කථාව නිම කළේ ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය

පිළිබඳ ව වක් මඟකින් කථා කරමිනි. ක්‍රිස්තුන් වහන්සේගෙන් ඔබ්බට ගියා වූ දෙවි කෙනකු ගැන පාවුල් කථා කළ බව ඔහුගේ කථාවට සවන් දුන් අයට දැනුන බව සියල්ලන්ගේ අදහස විය. ඉන් පැහැදිලිවන්නේ පාවුල් බහිෂ්කාර වාදයෙන් (exclusivism) අඩංගුතාවාදයට ( inclusivism) ගමන් කළ බව යි.

**බහිෂ්කාරවාදය :** (exclusivism ) **මා පමණක් නිවැරදි ය. ඔබ වැරදි ය.**
**අඩංගුතාවාදය :** (inclusivism ) **ඔබේ අදහස තරමක් දුරට නිවැරදි ය. එහෙත් මා සම්පූර්ණයෙන් ම නිවැරදි ය.**
**සත්‍යය ඔබ වෙත ඇත. එහෙත් පූර්ණ සත්‍යය මා වෙත ඇත.**

ශරීරය හා ශරීරාංග ගැන සඳහන් බයිබල් පාඨය හා සම්බන්ධ ඉගැන්වීම් තුළින් (1 කොරින්ති 12 : 12 31) පාවුල් තුමා බයිෂ්කාරවාදයෙන් (exclusivism) හා අඩංගුතාවාදයෙන් (inclusivism) ඔබ්බට යමින් බහුවිධවාදය හඳුන්වා දුන්නේ ය. විවිධාකාර දීමනා පිළිබඳ ව කොරින්තියේ ජනතාවට පැහැදිළි කරන පාවුල් තුමා සභාව තුළින් එය පිළිගන්නා බව පවසයි. ඒ දීමනාවන්ට ගරු කළ යුතු අතර, එවා පිළිගත යුතු අතර දෙවිඳුන්ගේ එක දීමනාවක් හෝ ප්‍රතික්ෂේප නොකළ යුතු බවට අවධාරණය කරයි. (1කොරින්ති 12 : 111) බහුවිධවාදී මානසික තත්වයක් අනුව කෙනකු තවත් කෙනකුට ගරු කරන අන්දමත් ඔවුන් පිළිගන්නා අන්දමත් දේව දීමනාවන්හි අවශ්‍යතාවයත් මෙහි පැහැදිළි වේ.

මෙම අදහස වර්තමානයේ සමාජයට හා සභා ජීවිතයට අදාළ කරන්නේ නම් සියලු දෙනා අසමාන වුවත්, වෙනස්කම් සහිත වුවත් ඒ හැම දෙනා ම වැදගත් බව හැඟෙනු ඒකාන්ත ය. එකිනෙකාට ගරු කරමින් එකිනෙකා පිළිගනිමින් අප ජීවත් විය යුතු ය.

බහුවිධවාදය - **ඔබ නිවැරදි ය. මා නිවැරදි ය.**
Pluralism **අපි එකට එක් ව ජීවත් වෙමු.**

**ඔබ වැරදි ය. මා ද වැරදි ය.**
**අපි එක් ව නිවැරදි වෙමු.**

**මා වැරදි ය. ඔබ නිවැරදි ය.**
**ඔබෙන් ඉගෙනීමට මම කැමැත්තෙමි.**

**මා නිවැරදිය. ඔබ වැරදි ය.**
**ඔබ ද එසේ සිතන්නේ නම් මා අනුගමනය කරන්න.**

## මුල් සභාවේ ජීවන රටාව, ජේසුස් වහන්සේගේ චින්තනය සහ අප

ජුදෙව් ජන වර්ගය තුළ ජීවත් වූ ජේසුස් වහන්සේ අන්‍ය ජන වර්ගයන්හි යහපත් ක්‍රියාවන් යහපත් ලෙස ම පිළිගත් සේක. ( මතෙව් 8 : 5 13 , 15 : 21 28, ලූක් 7 : 1 10 ) සමාරිතයන්ගේ යහපත් වටිනාකම් ජුදෙව් සමාජය ඉවත දැමූව ද ජේසුස් වහන්සේ ඒවා අගය කළ සේක.
(ජොහන් 4 , ලූක් 10 : 25 37 , ලූක් 17 : 1 19 ) මුල් කිතුනු සභාව ද ජේසුස් වහන්සේ පිළිගත්තේ සීමාවන් තුළ ය. දෙවිඳුන් තුළ ගරු බියෙන් හා යුක්ති ගරුකත්වයෙන් ජීවත් වූවන්"දෙවියන් වහන්සේගේ ජනතාව" ලෙස පේදුරු තුමා සැලකී ය. ( ක්‍රියා 10 : 34 35 ) දේව නිර්මාණයක් වූ මිනිසා මිනිස් නිර්මාණයන්ට වන්දනා මාන නොකොට ඒ සියල්ල මැවූවා වූ දෙවිඳුන්ට පමණක් නමස්කාර කළ යුතු බවට පාවුල් තුමා අවවාද කළේ ය. ( ක්‍රියා 14 : 12 17 )

මුල් සභාව ජේසුස් වහන්සේගේ ප්‍රේමය තුළ ජීවත් වූ බවට කිසිත් සැක නොමැත. එබැවින් ගැටළු උද්ගත වූ කල්හි ඒවාට මුහුණ පෑ අය සමඟ කථා කොට ඒවා සමථයකට පත්කරන ලදී. එය යහපත් අංගයක් ලෙස හඳුනාගත හැකි ය. ඔව්හු බල අධිකාරියට අභියෝග කරමින් ද ජේසුස් වහන්සේට කීකරු වෙමින් ද ජීවත් වූහ. එහෙත් මෙම විප්ලවාදී ජීවන රටාව අඛණ්ඩ ව ක්‍රියාත්මක නොවීමේ හේතුවෙන් වර්තමාන සභාව ද ආයතන ගත වී ඇත.

මෙය අමිහිරි සත්‍යයකි.

ජේසුස් වහන්සේ නපුර හෙළා දකිමින් යහපත මතු කරමින් දේව රාජ්‍යත්වයෙහි වටිනාකම් සඳහා ක්‍රියා කළ සේක. පීඩනයට පත් කරනු ලැබීම උන්වහන්සේ ප්‍රසිද්ධයේ විවේචනයට ලක් කළ සේක. ( ලූක් 13 : 32 33, මතෙව් 20 : 23 ) ව්‍යුහාත්මක වෙනසක් සඳහා සිය ඉගැන්වීම් යොදා ගනු ලැබිණි. එය ආරම්භ කරනු ලැබුවේ ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළිනි. කන්ද උඩ දේශනාව මේ සඳහා නිදසුන් සපය යි.

" එහෙත්, ජේසුස් වහන්සේ ඔවුන් තමන් වෙත කැඳවා මෙසේ වදාළ සේක. විජාතීන්ගේ ආණ්ඩුකාරයින් ඔවුන් කෙරේ ආධිපත්‍යය පවත්වන බවත්, ඔවුන්ගේ ප්‍රධානීන් ඔවුන් කෙරේ බලය පවත්වන බවත් ඔබ දන්නාහු ය. එහෙත්, ඔබ අතර එසේ නොවිය යුතු ය. ඔබ අතර යමෙක් නායකයා වන්න කැමැත්තේ නම් ඔහු ඔබේ දාසයා වන්නේ ය." ( මතෙව් 20 : 25 27 )

ජේසුස් වහන්සේ දුක් පීඩා ඇති කළ අධිකාරි ව්‍යුහය හෙළා දුටු සේක. උන්වන්සේ හෙරෝද රජ සිවලකු ලෙස හැඳින්විය. මෙය සතුරුකමේ ප්‍රකාශයක් නොවේ. අපගේ සතුරන්ට ප්‍රේම කළ යුතු බව ක්‍රිස්තුස් වහන්සේ ම දේශනා කළ සේක.

"නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න. සතුරාට වෛර කරන්නැයි කී බව ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි. ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න." ( මතෙව් 5 : 43 44 )

උන්වහන්සේ ක්‍රියා කළේ සතුරු බව හා වෛරය කේන්ද්‍රකොට ගත් සමාජ ව්‍යුහයෙහි සම්පූර්ණ පරිවර්තනයක් ඇති කරනු සඳහා ය. එහෙත් මුල් සභා නායකයින් විසින් රෝම අධිකාරිත්වයට දිව්‍යමය පාලන අනුමැතියක් දෙනු ලැබිණි. (රෝම 13 ) කීපදෙනෙක් එය අගය කළෝ ය. එහෙත් ක්‍රිස්තුස් වහන්සේ සිටියේ නම් එවැනි දෙයක් නොකරනු ලබන බවට සමහරු  විවේචනය කළහ. වර්තමානයේ අපගේ ක්‍රියාකාරිත්වය ගැන සිතා බැලිය යුතුයි. (ක්‍රිස්තුස් වහන්සේ වර්තමාන ශ්‍රී ලාංකික සමාජයට පැමිණියහොත් කුමක් කරාවි ද යන්න සිතා බලන්න.)

වර්තමානයේ ක්‍රිස්තුස් වහන්සේ ශ්‍රී ලංකාවට පැමිණියහොත් උන්වහන්සේ අනුගමනය කරනු ඇත්තේ බහුවිධ වාදී පිවිසුම බවට සැක නැත.

බොහෝ අයගේ විවිධ අදහස් උන්වහන්සේ පිළිගනු ඇත. මානව සබඳතා තර කරමින් වෛරයෙන් හා වර්ගවාදයෙන් තොර ව ක්‍රියා කරනු ඇත. ජේසුස් වහන්සේගේ චින්තනය අප සිත්හි තබාගෙන වර්තමාන සංදර්භය තුළ ජීවත් විය යුතු ය. එසේ ම මුල් කිතුනු ජීවන රටාව හා බැඳුනු මුල් කිතුනු සභා වටිනාකම් අපගේ ජීවිතවලට අනුගත කරගත යුතු ය.

❖ **ඇගැයීම :-**

1. වර්තමාන සංදර්භය තුළ ශ්‍රී ලංකාවට අදාළ කර ගත හැකි යහපත් වටිනාකම් අනුව පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. පළමුකොට මෙම වගුව ඔබේ අභ්‍යාස පොතට පිටපත් කරගන්න.

| මුල් කිතුනු සභාවේ වටිනාකම | දේව රාජ්‍යය තුළ ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ වටිනාකම් | වර්තමාන සංදර්භය තුළ ශ්‍රී ලාංකික සමාජයට අවශ්‍ය වන මානව වටිනාකම් |
|---|---|---|
| සහභාගිත්වය | ප්‍රේමය | |
| | | |
| | | |
| | | |
| | | |

2. වර්තමානයේ ක්‍රිස්තුස් වහන්සේ ශ්‍රී ලංකාවට පැමිණියහොත් උන්වහන්සේ අනුගමනය කරනු ඇත්තේ බහුවිධ වාදී පිවිසුමක් නොවන්නේ යැ යි ඔබ සිතන්නේ නම් එය සනාථ කිරීම සඳහා කරුණු ඉදිරිපත් කරන්න.